V නිගමන සහ නිර්දේශ

60. ශ්‍රී ලංකාව ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණවලට ළඟා වෙත්ම 2022 විරෝධතා දැක්වූ ශ්‍රී ලාංකිකයන් පුළුල් හරස් කඩක් ඉල්ලා සිටි පරිවර්තනීය වෙනස්කම්වලට නැවත කැපවීමට අවස්ථාවක් උදාව ඇත. ආණ්ඩුවට මැතිවරණ කාල සීමාවට පෙරාතුව, එම කාල සීමාව තුළ සහ ඉන් පසුව, විරෝධතාකරුවන්ට එරෙහිව අනවශ්‍ය සහ සීමාන්විත බලය යෙදවීමෙන් වැළකී සිටීම ඇතුළත්ව ප්‍රකාශනයේ නිදහස, සංගම් පැවැත්වීමේ සහ සාමකාමී රැස්වීමේ නිදහස ට ඇති අයිතිවාසිකම පූර්ණ වශයෙන් ආරක්ෂා කිරීම සහ ගරු කිරීම, ආගමික, ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය හෝ වෙනත් හේතු මත පදනම්ව බෙදුම්වාදී සහ වෙනස් කොට සැලකීමේ ප්‍රකාශ සහ භාවිතාවන් වැළැක්වීමට සහ පාලනය කිරීමට සහ මැතිවරණය හා සම්බන්ධ සහ අනෙකුත් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අපහරණ වැළැක්වීමට වගකීමක් පවතී.

61. සියලුම ශ්‍රී ලාංකිකයන් මත විශේෂයෙන්ම දුප්පත් සහ අවදානම් තත්වයේ පසුවන අනෙකුත් අය කෙරේ ඇති කරන ආර්ථික අර්බුදයේ බලපෑම සහ ණය බරින් ඇති කරන බලපෑම ගැන මහ කොමසාරිස් ට අවබෝධයක් පවතී. මෙම ආර්ථික පීඩණය ශ්‍රී ලංකාවට සහ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවලට පවතින ගෝලීය ආර්ථික තත්වය සහ අන්තර්ජාතික මූල්‍ය ව්‍යුහය නිසා තියුණු වී ඇත. ආර්ථික ප්‍රතිපත්තිය මූල්‍ය ස්ථායිකරණ වැඩ පිළිවෙළ ගැන තීරණ ගැනීමේ දී ප්‍රමාණවත් සමාජ ආරක්ෂණයක් තහවුරු කිරීම ඇතුළත් ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් බැඳීම් ඊට මග පෙන්විය යුතුයැයි ඔහු ඉල්ලා සිටී. ශ්‍රී ලංකාවේ විදෙස් ණය හිමියන් ආණ්ඩුවට ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මූල්‍ය අවකාශය ලබා දිය යුතු අතර වියදම් කපා හැරීමේ පියවර මානව අයිතිවාසිකම් පිළිබඳ බැඳීම් සපුරාලීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව දුර්වල නොකරන බවද තහවුරු කළ යුතුය.

62. නව පසුගාමී නීති, ප්‍රජාතන්ත්‍රීය සංවරණ සහ තුලනය බාදනයට ලක්වීම, වින්දිතයන්ට, සිවිල් සමාජයේ ක්‍රියාකාරිකයන්ට සහ ජනමාධ්‍යවේදීන්ට එරෙහිව තර්ජන, හිරිහැර කිරීම් සහ ප්‍රචණ්ඩත්වය මුදා හැරීම පිලිබඳ අවස්ථා සහ අතීතයේ පැවති බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් නැවතත් මතුවීමෙන් පෙන්නුම් කරන ආකාරයට මූලික නිදහසට ගරු කිරීමක් නොමැතිවීම ඇතුළත් වාර්තා කිරීමේ කාල සීමාවේ නිරීක්ෂණය කරන ලද මතුවෙමින් පවතින ප්‍රවනතා බරපතළ කණස්සල්ලට හේතුවේ.

63.  විශේෂයෙන්ම වින්දිතයන්ගේ දුක්පීඩාව හඳුනා ගැනීමට, බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝන සිදු කිරීමේ දී හමුදාවේ සහ අනෙකුත් ආරක්ෂක බලකායන්ගේ භූමිකාව පිළිගැනීමට අපොහොසත්වීම සහ අතීතයේ සිදු කළ සහ වර්තමානයේ සිදු වන උල්ලංඝනය කිරීම් ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකා රජය අපොහොසත්වීම නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහ පාලනයට මූලික බාධා බවට පත්ව ඇත. බරපතළ අපරාධ සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධයැයි විශ්වාස කළ හැකි බොහෝ ව්‍යුහයන් සහ රාජ්‍ය යාන්ත්‍රණයේ සමහර සාමාජිකයන් ඒ තැන්වලම සිටීමෙන් අර්ථාන්විත වගවීමේ ප්‍රගතියක් ඇති කිරීම වළක්වන අතර මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් දිගටම සිදු වේ. මානව අයිතිවාසිකම් මණ්ඩලයේ 51 වැනි සැසියට ඉදිරිපත් කළ වාර්තාවෙන් පෙන්නුම් කළ ආකාරයට ආයතන ගතව ඇති මුක්තිය ආර්ථික අර්බුදය සහ 2022 ජනතා විරෝධයක් පැන නැගීමට දායක වූ දූෂණය සහ බල අපහරණයෙන් කැපී පෙනේ.

64. ඡන්ද විමසීම්වලින් පසුව අලුතින් තේරීපත් වන ආණ්ඩුව, හදිසි කාර්යක් වශයෙන්, ගැටුමේ මූලික හේතූන් ආමන්ත්‍රණය කරන හා සියල්ලන් ඇතුළත් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික දැක්මක් අනුගමනය කළ යුතු අතර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට සහ දේශපාලන අධිකාරිය විමධ්‍යගත කිරීමට අවශ්‍ය මූලික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ආයතනික සංශෝධන සිදු කොට වගවීම සහ සන්හිඳියාව පෙරට ගෙන ආ යුතුය.

65. වගවීම, සංහිඳියාව පෙරට ගෙන ඒමට සහ අනාගතයේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ බල අපහරණය වැළැක්වීමට මූලික වෙනස්වීම් අවශ්‍ය ය. ඊට බරපතළ උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ අය ඉවත් කිරීම සඳහා පරීක්ෂා කිරීමක් ඇතුළත් වන ආරක්ෂක අංශවල කැපී පෙනෙන සංශෝධන ක්‍රියාත්මක කිරීම සහ මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට දැඩිව අනුකූල වන බව සහතික කෙරෙන මෙහෙයුම් සහ අධිකරණ රාමුවක් පිහිටුවීම ඇතුළත් ය. ආණ්ඩුව රටේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් බැඳීම්වලට ගැලපීමට අවශ්‍ය, බරපතළ උල්ලංඝනය කිරීම් නැවත සිදුවීම වැළැක්වීමට සහ විමධ්‍යගත කළ පාලන ක්‍රමයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, නෛතික සහ ආයතනික සංශෝධන කළ යුතුය. මෙම ගමන් මාර්ගයේ දී ශ්‍රී ලංකාවට සහාය දීමට මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය දිගටම සූදානමෙන් සිටී.

66. මානව අයිතිවාසිකම් මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ එක් එක් සාමාජිකයා මානව අයිතිවාසිකසිකම් මණ්ඩලයේ යෝජනා අංක 46/1 සහ 51/1 යටතේ වගවීමට අදාල වැඩ කිරීමට සහ රටේ අර්ථාන්විත වගවීමේ සහ සංහිඳියා ප්‍රයත්න සිදු කිරීමට අවශ්‍ය තත්වයන් සහ දේශපාලන කැපවීම නිර්මාණය කිරීමට දායක වීමෙන් සහ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ශක්තිමත් කළ හැකියාව පූර්ණව යොදා ගැනීමට සහාය ලබා දීමෙන් සහ එය යොදා ගැනීමෙන් ශ්‍රී ලංකාවේ වගවීමේ හිඩැස පියවීම නොකඩවා සිදු කළ යුතුය.

67. මහ කොමසාරිස් ගේ කලින් වාර්තාවලින් කරන ලද නිර්දේශ තවත් වර්ධනය කරමින් පහත සඳහන් නිර්දේශ ආණ්ඩුවට ඉදිරිපත් කෙරේ.[1]

(අ) වෙනස් කොට නොසැලකීම සහ කාන්තාවන්ට සහ සුළුතර ප්‍රජාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම, වෛරය සහ ප්‍රචණ්ඩත්වය උසි ගැන්වෙන ආගමික ක්‍රියාකාරිකයන්ගේ කතා සහ ක්‍රියා වැළැක්වීම සහ හෙළා දැකීම ඇතුළත් සියල්ලන් ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පදනම්ව ශ්‍රී ලංකාව සඳහා සියල්ලන් ඇතුළත් කර ගන්නා බහුත්වවාදී දැක්මක් ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම

(ආ) නිදහස් සහ සාධාරණ මැතිවරණ හරහා ආණ්ඩුවේ සියලු මට්ටම්වල දේශපාලන සහභාගිත්වයට ඇති අයිතිවාසිකම සහතික කිරීම

(ඇ) හමුදාව පවරා ගෙන ඇති ඉඩම් නිදහස් කිරීම, උතුරු සහ නැගෙනහිර අලුතින් ඉඩම් අල්ලා ගැනීම නතර කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දීර්ඝ කාලයක් රඳවා ගෙන ඇති සියලු දෙනා නිදහස් කිරීම සහ වින්දිතයන්ගේ සිහිපත් කිරීමේ මුලපිරුම් අපරාධයක් සේ සැලකීම ඉවත් කිරීම සහ ඒවාට සහාය ලබා දීම වැනි විශ්වාසය ගොඩ නැගීමේ පියවර ක්‍රියාත්මක කිරීමෙන් සංක්‍රාන්තික යුක්තිය ක්‍රියාත්මක කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම.

(ඈ) ආණ්ඩුවේ, ආරක්ෂක අංශවලට හෝ තානාපති තනතුරුවලට මෙන්ම විශේෂයෙන් සංක්‍රාන්තික යුක්තිය සහ වගවීම සාක්ෂාත් කර ගැනීමට පිහිටුවන ලද කිසියම් ආයතනයක ඉහළ මට්ටමේ තනුරුවලට මානව අයිතිවාසිකම් චෝදනා කෙළේයැයි විශ්වාස කළ හැකි අය පත් කිරීමෙන් හෝ උසස්වීම් ලබා දීමෙන් වැළකී සිටීම සහ බලයෙන් ඉවත් කිරීම.

(ඉ) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වහාම විලම්බනය කිරීම සහ ඒ වෙනුවට ගෙන එන කිසියම් පනතක් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියට සහ ප්‍රති-ත්‍රස්ත නීති සඳහා එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් විශේෂඥයන් විසින් කලින් සකස් කළ ප්‍රමිතීන්ට[2] ගැලපෙන බවට සහතික කිරීම

[1] A/HRC/46/20,para.60 and A/HRC/49/9, paras.67–69, A/HRC/51/5, paras.70–72; A/HRC/54/20, para.64.

[2] OLLKA,7/2021.

(ඊ) මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත, ICCPR පනත, කෙටුම්පත් කර ඇති රාජ්‍ය නොවන සංවිධාන පනත සහ විදුලි සංදේශන පනතට යෝජිත සංශෝධන ඇතුළත් මතයක් දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ, සංගම් පැවැත්වීමේ සහ සාමකාමී රැස්වීමේ නිදහස ට ඇති අයිතිවාසිකම අනවශ්‍ය ආකාරයෙන් සීමා කෙරෙන පවතින හෝ යෝජිත පනත් අහෝසි කිරීම හෝ සංශෝධනය කිරීම

(උ) අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, නීතියෙන් පරිබාහිරව සිදු කෙරෙන ඝාතන, වධ හිංසා පැමිණවීම, ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වෙනත් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් තහනම් බවත් ඒ ගැන ක්‍රමානුකූලව විමර්ශනය කොට දඬුවම් කරන බවත් හමුදාවේ, බුද්ධි අංශ සහ පොලීසියේ සියලු අංශවලට පැහැදිලි උපදෙස් මගින් ප්‍රසිද්ධියේ නිකුත් කිරීම

(ඌ) හදිසි කටයුත්තක් සේ අදාල තොරතුරු තක්සේරු කිරීමට සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ පසුගිය දශකවල සිදු කරන ලද අන්තර්ජාතික මානුෂීය නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන්වලට අදාලව ස්වාධීන අභිචෝදනාත්මක තීරණ ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යන්ගෙන් වෙනස් වූ ස්වාධීන අභිචෝදනාත්මක අධිකාරියක් පිහිටුවීම

(එ) නීතිය බලාත්මක කිරීමේ දී, වානිජ සහ සිවිල් කටයුතුවලදී හමුදාවේ මැදිහත්වීම වැළැක්වීම සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල හමුදාව නතර කර තැබීම සැලකිය යුතු ආකාරයෙන් අඩු කිරීම

(ඒ) සියලු ආකාරයේ සෝදිසි කිරීම් සහ හිරිහැර කිරීම් සහ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට, ජනමාධ්‍යවේදීන්ට, මානව අයිතිවාසිකම් උල්ලංඝනයේ වින්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල් වලට විශේෂයෙන්ම කාන්තාවන්ට එරෙහි පලිගැනීම් වහාම නතර කිරීමට සියලුම ආරක්ෂක ආයතනවලට සහ බුද්ධි අංශවලට නියෝග කිරීම.

(ඔ) අවාසි සහ කොන් කරන ලද පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල ජීවන මට්ටම කෙරේ බලපාන වියදම් කපා හැරීමේ පියවර තක්සේරු කිරීම සහ සැහැල්ලු කිරීම, විශේෂයෙන්ම මෙම පුද්ගලයන් ගේ සහ කණ්ඩායම්වල අන්තර්ජාතික ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සම්මුතිය යටතේ කේන්ද්‍රීය අන්තර්ගතය වූ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සුදුසු පියවර සියල්ල ගැනීම.

(ඕ) මානව අයිතිවාසිකම් භුක්ති විඳීම කෙරේ දූෂණයේ නිෂේධනීය බලපෑම තක්සේරු කිරීම සහ මානව අයිතිවාසිකම් බැඳීම් සමග සම්බන්ධව ඇති දූෂණ විරෝධී පියවර සම්මත කිරීම, සහතික කිරීම

(ක) සමාජ ආරක්ෂණයට මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම ඇතුළත් අවාසි සහ කොන් වූ පුද්ගලයන් සහ කණ්ඩායම්වලට සමාජ ආරක්ෂණ පියවර ලැබෙන බවට සහතික කිරීම

(ඛ) පාරදෘශ්‍ය, උපදේශනාත්මක, අපක්ෂපාති සහ වෙනස් කොට සැලකීමක් නැති මාර්ගවලින් ඉඩම් ආරවුල් විනිශ්චය කිරීම සහ ආගමික ස්ථාන ඉදි කිරීමේ දී අන්තර්ආගමික සංවාදයක් පැවැත්වීම සහතික කිරීම

(ග) යුක්තිය මෙහෙයුම නතර කොට මෙම මෙහෙයුම යටතේ රඳවා ගෙන ඇති සියලු පුද්ගලයන් නිදහස් කරන්න. මත්ද්‍රව්‍යවලට නැඹුරුතාවයක් ඇති ජනතාවට ප්‍රජා මූලික ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ හානිය අඩු කිරීමේ සහාය ලබා දීම, සහ මානව අයිතිවාසිකම් සහ මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රතිපත්ති සඳහා අන්තර්ජාතික මග පෙන්වීම්වලට[3] ගැලපෙන ආකාරයට මානව අයිතිවාසිකම් සහ මහජන සෞඛ්‍යය කේන්ද්‍රීය මත්ද්‍රව්‍ය ප්‍රතිපත්තියක් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම

[3] https://www.undp.org/publications/international-guidelines-human-rights-and-drug-policy#.

(ඍ) සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් වැළැක්වීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතියේ 31 වගන්තිය යටතේ කරනු ලබන සන්නිවේදන ලබා ගැනීමට සහ සැලකිල්ලට ගැනීමට බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ කොමිටියේ ශක්තතාවය පිළිගැනීම සහ අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව අනුමත කිරීම

68. මානව අයිතිවාසිකම් කවුන්සලය සහ සාමාජික රාජ්‍යයන් අදාලවන ආකාරයට,

(අ) පිළිගත් භූමි ප්‍රදේශයෙන් පරිබාහිර හෝ විශ්ව අධිකරණයේ පිළිගත් මුලධර්ම යටතේ, අදාල අන්තර්ජාතික ජාල සහ අන්‍යොන්‍ය නීති ආධාර ක්‍රියාවලීන් යටතේ සහ දිවි ගලවා ගත් අය, එම පවුල් සහ ඔවුන් ගේ නියෝජිතයන් ගේ සහයෝගයෙන් ජාතික අධිකරණයේ අධිකරණ ක්‍රියා පටිපාටි හරහා ශ්‍රී ලංකාවේ සියලුම පාර්ශ්වයන් විසින් සිදු කරන ලදැයි කියන අන්තර්ජාතික අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී සහ අභිචෝදනා ඉදිරිපත් කිරීමේ දී සහයෝගයෙන් කටයුතු කිරීම

(ආ) ශ්‍රී ලංකාවේ වගවීමේ ප්‍රගමනය සඳහා වෙනත් අන්තර්ජාතික නෛතික විකල්ප යොදා ගැනීම සලකා බැලීම

(ඇ) අන්තර්ජාතික නීතිය සමග ගැලපෙන සහ වගවීමේ පියවර පුළුල් සීමාවක කොටසක් වශයෙන් බරපතළ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ බරපතළ මානුෂීය නීති උල්ලංඝනය කිරීම් සිදු කෙළේයැයි විශ්වාස කළ හැකි පුද්ගලයන්ට එරෙහිව භාවිතය තහනම් කිරීම සහ සංචාරක තහනම වැනි තවදුරටත් ඉලක්ක කර ගත් සම්බාධක පැනවීම සොයා බැලීම සහ

(ඈ) පලිගැනීමේ තර්ජනයට මුහුණ දී ඇති ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් රැකවරණය ලබා දීමේ පියවර සමාලෝචනය කිරීම සහ වධ හිංසා පැමිණවීම හෝ වෙනත් බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ තර්ජනයක් පවතින අය ආපසු කැඳවීමෙන් ( refoulement ) වැළකී සිටීම සහ

(ඉ) ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අදාල අපරාධවල වගවීම පිළිබඳ වැඩ අධීක්ෂණය සහ වාර්තා කිරීම සහ ශක්තිමත් කිරීම දිගටම පවත්වා ගැනීමට මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට නොකඩවා සහයෝගය ලබා දීම,

මහ කොමසාරිස් නිර්දේශ කරයි.